# සුදුසු කාර්යමණ්ඩය හා ස්වේච්ඡා වෘත්තිකයන් තෝරා ගැනීම, අධීක්ෂණය කිරීම, හා වර්ධනය කිරීම පිළිබඳ ප්‍රායෝගික මාර්ගෝපදේශය

| ආරක්ෂිත කාර්යමණ්ඩය හා ස්වේච්ඡා වෘත්තිකයන් තෝරා ගැනීම | ප්‍රායෝගික යෝජනා | මනා ප්‍රතිඵල |
|---|---|---|
| කාර්යභාරයට දරුවන් සමග සෘජු හෝ වක්‍ර සම්බන්ධතා ඇත්දැයි යන්න හෝ එයට දරුවන් හා ඔවුන්ගේ පවුල් සම්බන්ධ සංවේදී තොරතුරුවලට ප්‍රවේශය ඇත්තේ දැයි තීරණය කරන්න. | දරුවන් සමග කාර්යභාරයට කවර ආකාරයේ සම්බන්ධතාවක් පවතින්නේද හා තනි දරුවන් පිළිබඳ තොරතුරු සඳහා කුමන ආකාරයේ ප්‍රවේශයක් තිබේද යන්න ඇගයීමට ලක් කිරීම මගින් පහත දැක්වෙන දේ තීරණය කෙරෙනු ඇත:<br>• කාර්යභාරයට දරුවන් සමග කටයුතු කිරීමේ පරීක්ෂාවක් නීතිමය වශයෙන් අවශ්‍ය ද එසේ නැත්නම්, දරුවන්ට ඇති අවදානම අවම කිරීම සඳහා දරුවන් සමග කටයුතු කිරීමේ පරීක්ෂාවක් අවශ්‍යද යන්න<br>• වෙනත් නිවාරණයන් හා පරීක්ෂාවන් අවශ්‍යද යන්න<br>• කාර්යභාරයට අවශ්‍ය වන පුහුණුවේ ස්වභාවය හා අධීක්ෂණ මට්ටම | පවත්නා කාර්යභාරය සඳහා නිසි මට්ටමේ පසුබිම් පරීක්ෂා, පුහුණු හා අධීක්ෂණ. |
| රැකියා විස්තරය සඳහා රාජකාරී ප්‍රකාශයක් සකස් කරන්න. | රාජකාරී ප්‍රකාශයක් හෝ රැකියා විස්තරයක් මගින් තනතුරෙහි කාර්යභාරය, වගකීම් හා අපේක්ෂාවන් පැහැදිලි කරන අතර වාර්තා කළ යුතු දේවල් ගැන සඳහන් කරයි.<br><br>තනතුර සඳහා දරුවන් සමග කටයුතු කිරීමේ පරීක්ෂාවක්, වෘත්තීමය ලියාපදිංචියක් හෝ සුදුසුකමක් අවශ්‍ය දැයි තීරණය කරන්න. | වඩාත් ම සුදුසු කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් බඳවා ගැනීම |

| ආරක්ෂිත කාර්යමණ්ඩය හා ස්වේච්ඡා වෘත්තිකයන් තෝරා ගැනීම | ප්‍රායෝගික යෝජනා | මනා ප්‍රතිඵල |
|---|---|---|
| ප්‍රධාන තෝරාගැනීම් නිර්නායක සකස් කරන්න. | තෝරා ගැනීම් නිර්නායක මගින් රාජකාරී ප්‍රකාශයේ දක්වා ඇති රාජකාරි සහ කටයුතු සිදු කිරීමට අවශ්‍ය ප්‍රධාන කුසලතා, ලක්ෂණ හා අත්දැකීම් හඳුනාගැනීමට උපකාර කරයි. | ඔබට අවශ්‍ය කුමක්දැයි කලින් සිතා බැලීම මගින් කාර්යභාරය සඳහා නිවැරදි පුද්ගලයා සොයා ගැනීම පහසු වනු ඇත. |
| තනතුර ගැන දැන්වීමක් පළ කරන්න. | ඔබ ළමා ආරක්ෂණ හා යහපැවැතුම් ප්‍රතිපත්තියක් සහිත ළමා ආරක්ෂක සංවිධානයක් බව ප්‍රවර්ධනය කරන්න. | ළමා ආරක්ෂාව ඔබේ සංවිධානයේ සංස්කෘතියේ කොටසක් බවත්, එමගින් සංවිධානය හා සමාන අගනාකම් ඇති පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමට උපකාරී වන බවත් පැහැදිලි කරන්න. |
| අයදුම්කරුවන් සමග සම්මුඛසාකච්ඡා පවත්වන්න | දරුවන් සමග කටයුතු කිරීම සම්බන්ධයෙන් අයදුම්කරුගේ පෙළඹවීම ගැන විමසන්න.<br>අයදුම්කරුවන්ගේ සැබෑ ජීවිත අත්දැකීම් හා පහත දැක්වෙන කරුණු ගැන ඔවුන්ගේ අවබෝධය සම්බන්ධයෙන් ප්‍රශ්න අසන්න:<br>• දරුවන්ගේ ශාරීරික හා චිත්තවේගී අවශ්‍යතා<br>• වෘත්තීමය සීමාවන්<br>• දරුවන්ගේ හිමිකම්<br>අයදුම්කරුවන්ගේ අගනාකම් පිළිබඳ සොයා බලමින්, ඒවා ළමා ආරක්ෂාව සහ යහපැවැත්ම කෙරෙහි මෙන් ම ළමා හිංසනය හා හානි වැලැක්වීම කෙරෙහි වන කැපවීම සමග සමපාත වන්නේ දැයි සොයා බලන්න.<br>ආදිවාසී සංස්කෘතිකමය ආරක්ෂාව පිළිබඳව මෙන් ම සියලු දරුවන් හා ඔවුන්ගේ පවුල් වෙනුවෙන් වන ඇතුළත්කරණ ප්‍රතිපත්ති පිළිබඳව අයදුම්කරුගේ ප්‍රවේශය සාකච්ඡා කරන්න.<br>**ප්‍රයෝජනවත් විය හැකි ප්‍රශ්න වන්නේ:**<br>• දරුවන් හා යොවුන් පුද්ගලයන් සමග, එසේ නැත්නම්, දරුවන් හා යොවුන් පුද්ගලයන් වෙනුවෙන් කටයුතු කරන ආයතන සමග ඔබට අත්දැකීම් ඇත්නම් ඒවා ලැයිස්තුගත කරන්න. මෙය | මෙම ක්‍රියාවලිය මගින් අයදුම්කරුවකුගේ කුසලතා හා උචිතබව සාධාරණ ලෙස ඇගයීම සඳහා අවස්ථාව සලසයි. |

| **ආරක්ෂිත කාර්යමණ්ඩය හා ස්වේච්ඡා වෘත්තිකයන් තෝරා ගැනීම** | **ප්‍රායෝගික යෝජනා** | **මනා ප්‍රතිඵල** |
|---|---|---|
| | ඔබගේ වෘත්තීමය හා පෞද්ගලික ජීවිතයේ දී විය හැකිය (ක්‍රීඩා ආදී ස්වේච්ඡාවෙන් සිදු කරන කාර්යභාර ඇතුළුව)<br>• වැඩිහිටියෙකු හා දරුවෙකු හෝ යොවුන් පුද්ගලයෙකු අතර උචිත හා අනුචිත කටයුතු ලෙස ඔබ සලකන දේ ගැන උදාහරණ දෙන්න.<br>• ඔබ සමග වැඩ කරන කෙනෙකු දරුවෙකු සමග අනුචිතව කටයුතු කරන බව ඔබට පෙනී ගියහොත්, ඔබ කරන්නේ කුමක්ද?<br>• ඔබ දරුවන් හා යොවුන් පුද්ගලයන් සමග සම්බන්ධ වීමේ ප්‍රවේශය ඔබට විස්තර කළ හැක්කේ කෙසේද?<br><br>අයදුම්කරුවන් පිළිබඳ අදහස් සාකච්ඡා කිරීම කළ හැකි වන පරිදි තේරීම් මණ්ඩලයේ එක් අයෙකුට වඩා වැඩි ගණනක් තබා ගන්න. හැකි නම් විවිධ චරිත ලක්ෂණවලින් යුත් හා විවිධ පසුබිම් සහිත පුද්ගලයන්, විවිධ ලිංගික සමාජභාවයන්ට අයත් අය, තේරීම් මණ්ඩලයේ තබා ගන්න. යොවුන් පුද්ගලයෙකු මණ්ඩලයට ඇතුළත් කර ගැනීම, ඔබට වෙනත් දෘෂ්ටිකෝණයක් වෙත යොමු වීමට උපකාරී විය හැකිය.<br><br>පත්කර ගත යුත්තේ කුමන පුද්ගලයාද යන්න ගැන අවිනිශ්චිතතාවක් ඇත්නම් හෝ අයදුම්කරු සම්බන්ධයෙන් චකිතයක් ඇති අවස්ථාවන් හි දී, දෙවැනි සම්මුඛ පරීක්ෂණයක් පවත්වන්න. පුද්ගලයන් වඩාත් හොඳින් හඳුනා ගැනීමට හැකිවන පරිදි, වඩා නිදහස් සංවාදයක් හා අදහස් හුවමාරු කර ගැනීම දිරිගන්වමින් දෙවැනි සම්මුඛ පරීක්ෂණයේ දී වඩාත් අවිධිමත් සාකච්ඡාවක් පැවැත්වීමට ඔබට අවශ්‍ය විය හැකිය. | |
| අවම වශයෙන් යොමු පරීක්ෂාවන් දෙකක්වත් සිදු කරන්න. | යටත් පිරිසෙයින් යොමු පරීක්ෂාවන් දෙකක්වත් සිදු කළ යුතු වේ. ලිඛිත යොමු භාර ගැනීම සිදු නොකරන්න. ඔබ සෑම විටම නිර්දේශකයා සමග කතා කළ යුතුය.<br><br>අඩු වශයෙන් එක් නිර්දේශකයෙක් ලෙස අයදුම්කරුගේ වත්මන් හෝ වඩාත් නූතන සේවායෝජකයා ලබා දෙන ලෙස ඉල්ලා සිටින්න. | අයදුම්කරුවන් සම්බන්ධයෙන් තොරතුරු එක්රැස් කිරීම, ඔබට අයදුම්කරුවන්ගේ උචිතබව ගැන අවබෝධාත්මක තීරණයක් ගැනීමට උපකාරී වේ. |

| ආරක්ෂිත කාර්යමණ්ඩය හා ස්වේච්ඡා වෘත්තිකයන් තෝරා ගැනීම | ප්‍රායෝගික යෝජනා | මනා ප්‍රතිඵල |
|---|---|---|
| | නිර්දේශකයා විසින් අයදුම්කරු දරුවන් සමග කටයුතු කර තිබෙනු පෞද්ගලිකව නිරීක්ෂණය කර තිබිය යුතුය.<br>**ප්‍රයෝජනවත් විය හැකි ප්‍රශ්න වන්නේ:**<br>• අදාළ පුද්ගලයා දරුවන් සමග කටයුතු කරනු ඔබ නිරීක්ෂණය කර තිබේද? අදාළ පුද්ගලයා දරුවන් සමග පවත්වා ඇති සම්බන්ධතාවන්ගේ හා අන්තර්ක්‍රියාවන්ගේ ස්වභාවය ගැන ඔබට විස්තර කළ හැකිද?<br>• ඔබ අයදුම්කරුව නැවත සේවයට එක් කර ගැනීමට කැමතිද?<br>• අයදුම්කරු දරුවන් සමග සෘජුව කටයුතු කිරීම සම්බන්ධයෙන් ඔබට ගැටලු තිබේද?<br>• අයදුම්කරු සමහර අවස්ථාවල දී දරුවන් සමග තනිව සිටිය හැකි බව දැනගැනීම ඔබට ගැටලුවක්ද?<br>• අයදුම්කරු විසින් දරුවකුගේ අභියෝගාත්මක චර්යාවක් සම්බන්ධයෙන් කටයුතු කළ ආකාරය ඔබ නිරීක්ෂණය කළ අවස්ථාවක් සම්බන්ධ උදාහරණයක් ඔබට දිය හැකිද?<br>• ඔබට අදාළ පුද්ගලයා සම්බන්ධයෙන් යම් විනය ගැටලු හෝ ඔවුන් සංවිධානයේ අචාරධර්ම පද්ධතියට අනුකූළ වීම සම්බන්ධයෙන් ගැටලු තිබේද? | |
| කාර්යමණ්ඩලයේ සහ ස්වේච්ඡා වෘත්තිකයන්ට ප්‍රේරණය, අධීක්ෂණය, සහාය හා නිරීක්ෂණය ලබා දෙන්න | නව කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් සංවිධානයේ ළමා ආරක්ෂක හා යහපැවතුම් ප්‍රතිපත්තිය, අචාරධර්ම පද්ධතිය හා අදාළ වන ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් දැනුවත් කරන්න.<br>පහත දැක්වෙන දේ සම්බන්ධයෙන් අඛණ්ඩ පුහුණුව සපයන්න:<br>• ළමා හිංසනය හා හානි පිළිබඳ සංඥා හඳුනාගැනීම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම<br>• දරුවකුට සිදුවන හානි ගැන කිසියම් අයෙකු සිදුකරන අනාවරණයකට සහයෝගය දැක්වීම<br>• ළමා හිංසනය හා හානි සඳහා ඇති අවදානම් ඇගයීම හා කළමනාකරණය කිරීම | දරුවන් ආරක්ෂිතව තබා ගන්නේ කෙසේද, හානි වළක්වා ගන්නේ හා අවම කරන්නේ කෙසේද සහ විශ්වාසයෙන් යුතුව කටයුතු කරන්නේ කෙසේද යන්න ගැන අවබෝධයක් කාර්යමණ්ඩලයට හා ස්වේච්ඡා වෘත්තිකයන්ට තිබිය යුතුය. |

| ආරක්ෂිත කාර්යමණ්ඩය හා ස්වේච්ඡා වෘත්තිකයන් තෝරා ගැනීම | ප්‍රායෝගික යෝජනා | මනා ප්‍රතිඵල |
|---|---|---|
| | • දරුවන් බලගැන්වීම හා ඔවුන්ගේ සහභාගීත්වය<br>• වාර්තා පවත්වාගෙන යාම හා තොරතුරු හුවමාරුව<br>• ළමා ආරක්ෂක පැමිණිලි හා ප්‍රතිචාර සම්බන්ධ වගකීම්<br>• සංස්කෘතික ආරක්ෂාව හා ඇතුළත්කරණ ප්‍රතිපත්ති.<br><br>කාර්යමණ්ඩලය හා ස්වේච්ඡා වෘත්තිකයන් අඛණ්ඩව අධීක්ෂණය හා කළමනාකරණය කිරීමේ දී ළමා ආරක්ෂාව හා යහපැවැත්ම පිළිබඳව අවධාරණය කළ යුතුය. මෙය නිරන්තර කාර්යමණ්ඩල අධීක්ෂණය, වෘත්තීමය සංවර්ධන සැලසුම් හා කාර්යමණ්ඩල සංසද හා රැස්වීම් ඔස්සේ සිදු කළ හැකිය.<br><br>කිසියම් කාර්යමණ්ඩල සාමාජිකයෙක් හෝ ස්වේච්ඡා වෘත්තිකයෙක් සංවිධානයේ ළමා ආරක්ෂා හා යහපැවතුම් සම්බන්ධ අචාර ධර්ම පද්ධතියට අනුකූලව කටයුතු නොකරන්නේ නම්, ඒ ගැන ක්‍රියාමාර්ග ගත යුතුය. එය කාර්යමණ්ඩල සාමාජිකයාට හෝ ස්වේච්ඡා වෘත්තිකයාට පෙන්වා දී ඔවුන් තම චර්යාවේ වෙනසක් සිදු කරන්නේ දැයි ගැන විමසා බැලිය යුතුය. | |